ශ්‍රී ලංකා පදනම් ආයතනය

ජර්මන් ෆෙඩරල් ජනරජයේ ෆෙඩ්රිච් ඊබට් පදනම (1925 දී ආරම්භය) සහ ශ්‍රී ලංකා ජනරජයේ, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන පණතෙන් ව්‍යවස්ථාපිත ශ්‍රී ලංකා පදනම් පණතින් අතර අරඹන ලද ඒකාබද්ධ ක්‍රියා මාර්ගයකින් දැනට පවත්නා අන්‍යොන්‍ය අවබෝධය හා මිත්‍රත්වය වැඩි දියුණු කිරීමේ අරමුනු උදෙසා ශ්‍රී ලංකා පදනම් ආයතනය පිහිටුවන ලදී. මෙම ආයතනයේ අරමුණු හා පරමාර්ථ පහත සඳහන් අයුරින් සපුරාලනු ඇත.

1. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමය පිළබඳ විශ්වාසය සහ අදහස් තහවුරු කිරීම සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

2. කුල, ආගම්, භාෂා, වර්ණ, ස්ත්‍රී පුරුෂ, ජාතී ආදී භේදයන්ගෙන් තොරව මූලික නිදහස සහ මානව අයිතිවාසිකම් සුරැකිම සඳහා විශ්ව ගෞරවයෙන් යුතුව ජාත්‍යන්තර සුහදතාවය සහ සහයෝගය තහවුරු කිරීම

3. මහජනතාව තුළ සමාජ වර්ධනය සහ සෑම අංගයක් පිළිබඳවම දැනුම වැඩිම හා ප්‍රචලිත කිරීම සඳහා දිරිගැන්වීමේ ප්‍රවර්ධනය කිරීම උදෙසා අධ්‍යාපනය ලබාදීම.

ඉහත පරමාර්ථ සපුරාලීම සඳහා මානව අයිතිවාසිකම් යහපාලනය හා කාර්මික සම්බන්ධතා වශයෙන් ක්ෂේත්‍ර 3ක් ඔස්සේ වැඩමුළු, දේශන, සම්මන්ත්‍රණ / ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලැබේ.


**අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා පදනම් ආයතනය**
**නො. 100, නිදහස් චතුරස්‍රය**
**කොළඹ 07**

**දුරකථනය 2695249 සහ 2691814 ෆැක්ස් 2679686**
**විද්‍යුත් තැපෑල** slfi_director@padanama.org


*ජනාධිපති ලේකම් කාර්යාලය*
*ශ්‍රී ලංකා පදනම*

# සමාජ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2010



සංවිධානය හා මෙහෙයවීම

## ශ්‍රී ලංකා පදනම් ආයතනය

හැඳින්වීම

ඉතා දැඩි ආපදා තත්ත්වයකට මුහුණ දුන් ශ්‍රී ලාංකික සමාජයේ ජනතාව පශ්චාත් සුනාමි හා යුධමය තත්ත්වයේ ප්‍රතිඵලයන් අත්දකිමින් සිටිති. එවන් පසුබිමක ජීවත්වන ජනතාව නගා සිටුවමින් ඔවුන් සංවර්ධනය කිරීම යුගයේ අවශ්‍යතාවයකි.

එසේම ශ්‍රී ලංකා සමාජය අන් කවරදාකටත් වඩා සමාජ සංවර්ධන කාර්ය කෙරෙහි අවධානය යොමු කොට ඇති පසුබිමක් තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්ය මණ්ඩල මේ කෙරෙහි යොමු වෙමින් පවතී. එබැවින් එම කාර්යන් වඩාත් ඵලදායිව ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩල නිලධාරීන්, සමාජ සංවර්ධනය පිළිබඳව න්‍යායික හා ප්‍රායෝගික දැනුමෙන් සන්නද්ධ කොට සමාජ සවිබල ගැන්වීමේ කාර්යට දායක කර ගැනීමට මෙම පාඨමාලාව සැලසුම් කොට ඇත.

- ❖ අරමුණුසමාජයක සංයුතිය, සංකීර්ණත්වය හා ගති ලක්ෂණ හඳුනා ගැනීමසමාජ සංවර්ධනය පිළිබඳ සංකල්ප හා න්‍යාය පිළිබඳ දැනුම ලබා ගැනීම
- ❖ සමාජ සංවර්ධනය සඳහා අනුගමනය කල යුතු ප්‍රවේශ හා ක්‍රමවේද පිළිබඳ දැනුම හා කුසලතා ලබා ගැනීම
- ❖ සමාජ සංවර්ධනය සඳහා ආයතනික කාර්ය භාරය පැහැදිලි කිරීම
- ❖ සමාජ සජීවකාරකයකු ලෙසට ප්‍රගුණ කරගත යුතු දැනුම, කුසලතා ආකල්ප ප්‍රවර්ධනය කිරීම

**පාඨමාලාවේ කාලය**
පැය 480 කි (එක් අවුරුදු පාඨමාලාවකි)
(දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්ද මීට ඇතුලත් වේ)

**පැවැත්වෙන පිළිවෙල**

- මෙම පාඨමාලාව මොඩියුල 8 කින් සමන්විතය.පාඨමාලාව සාර්ථකව නිම කිරීම සඳහා මොඩියුල 08 ම සමත් විය යුතුය.
- පාඨමාලාව සෑම මසකම සතියේ සෙනසුරාදා දිනවල සහ මාසයේ අන්තිම ඉරිදා දිනයක පැවැත්වෙන මොඩියුලකින් යුක්තව පෙළ ගැසේ.
- සෑම මොඩියුලයක් අවසානයේම ඊට අදාළ ඇගයීම් සිදු කෙරෙනු ඇත.පාඨමාලාව අවසානයේ ස්වාධීන නිබන්ධනයක් ඉදිරිපත් කල යුතුය.

**පාඨමාලාවට ඇතුළත් වීමට තිබිය යුතු සුදුසුකම්**

අ. පො. ස (සා. පෙළ) සමග ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද හෝ
අ. පො. ස. (උ. පෙළ) සමග ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද හෝ
පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධිය ලබා තිබීම

**පාඨමාලාවේ අන්තර්ගතය**

ශ්‍රී ලංකා සමාජය හඳුනා ගැනීම, සමාජ සංවර්ධනය හා සමාජ වැඩ, ව්‍යාපෘති සැලසුම්කරණය, සමාජ හා ප්‍රජා සංවර්ධන ප්‍රවේශ සඳහා කළමනාකරණ විධි ක්‍රම, සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශ, පෞරුෂ හා මානව චර්යාව, වැඩිහිටි අධ්‍යාපනය හා පුහුණු කුසලතා සංවර්ධනය, පර්යේෂණ ශිල්පක්‍රම, ස්වාධීන නිබන්ධය (ප්‍රායෝගික ක්‍රියාකාරකම් මත පදනම් වූ ස්වාධීන නිබන්ධය)

මීට අමතරව ක්ෂේත්‍ර චාරිකා, ආරාධිත දේශන සහ වැඩමුළු සංවිධාන කර ඇත.

| | |
|---|---|
| කාලසීමාව | එක් වසරකි |
| පුහුණුව | සෑම සෙනසුරාදා දින සහ මාසයේ අවසාන ඉරිදා දින |
| මාධ්‍යය | සිංහල |
| ස්ථානය | ශ්‍රී ලංකා පදනම් ආයතනය, අංක 100, නිදහස් චතුරස්‍රය, කොළඹ 07. |
| ලියාපදිංචි ගාස්තුව | රු.500/- |
| පාඨමාලා ගාස්තු | රු.35,000/- (වාරික දෙකකින් ගෙවිය හැකිය.) |

මූලික අධ්‍යාපන සුදුසුකම්

අ. පො. ස (සා පෙළ) සමග ක්ෂේත්‍රයේ වසර 5 පළපුරුද්ද හෝ අ. පො. ස (උ. පෙළ) සමග ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධිය ලබා තිබීම

අයදුම්පත් සහ ලියාපදිංචිය සඳහා පාඨමාලා සම්බන්ධීකාරක අමතන්න. අදාල අයදුම්පත් ශ්‍රී ලංකා පදනමේ වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.

සම්බන්ධීකාරක
සමාජ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
ශ්‍රී ලංකා පදනම් ආයතනය
ශ්‍රී ලංකා පදනම
අංක 100, නිදහස් චතුරස්‍රය, කොළඹ 07
දුරකථන අංක 011-2695249 / 011 -2691814
ඊ-මේල්: director_slfi@padanama.org
වෙබ් අඩවිය www'padanama.org